# ප්‍රසම්පාදන දැන්වීමයි.

## සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

## පාවිච්චි කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පහත විස්තර සඳහන් පාවිච්චි කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | වාහන අංකය | වාහන මාදිලිය හා වාහන පන්තිය | නිෂ්පාදිත වර්ෂය | ඉන්ධන වර්ගය | ආපසු නොගෙවනු ලබන ලංසු ගාස්තු | ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ මුදල |
|---|---|---|---|---|---|---|
| 01 | GB - 8064 | L200- DUBLE CAB -DUAL PURPOSE VEHICLE | 2000 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 02 | 226 - 3953 | MOTOR LORRY | 1999 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 03 | 227 - 1925 | CLOSED - MOTOR LORRY | 1999 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 04 | 253 - 6274 | DUBLE CAB- DUAL PURPOSE VEHICLE | 1998 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 05 | GL - 4471 | DEFENDER – MOTOR CAR | 2001 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 06 | 59 - 0466 | LN85R-PRMRS - DUAL PURPOSE VEHICLE | 1996 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 07 | 59 - 0374 | HILUX - DUAL PURPOSE VEHICLE | 1996 | ඩීසල් | රු.2,000.00 | රු.25,000.00 |
| 08 | MITSUBISHI PEJERO | අබලි | 1995 | | රු.2,000.00 | රු.25,000.00 |
| 09 | MITSUBISHI DUBLE CAB | අබලි | 1995 | | රු.2,000.00 | රු.25,000.00 |
| 10 | BAJAJ- PLATINA | අබලි | 2010 | | රු.500.00 | රු. 3,000.00 |
| 11 | HONDA CD100 | අබලි | 1995 | | රු.500.00 | රු. 3,000.00 |

මෙම ප්‍රසම්පාදනයට සහභාගී වීමට සුදුසුකම් ලබන්නේ ශ්‍රී ලාංකික පුරවැසියන් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි සමාගම් හෝ සංවිධාන පමණි. ජාතික හැඳුනුම්පතේ (NIC) හෝ සමාගමේ හෝ සංවිධානයේ ලියාපදිංචි සහතිකයේ සහතික කළ පිටපතක් ලංසු අයදුම්පත සමඟ ඉදිරිපත් කිරීමට අමුණා තිබිය යුතුය.

මෙම විකිණීමට ඉදිරිපත් කර ඇති වාහන 2025.11.13 දින සිට 2025.11.28 දින දක්වා කාර්යාල දිනයන්හි පෙ.ව.10.00 සිට ප.ව.3.00 දක්වා කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 428/9/A දරන ස්ථානයේදී (විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යාබද ඉඩම) පරීක්ෂාකර බැලිය හැකිය.

මෙම වාහන විකිණීම සඳහා ලංසු ලේඛන නිකුත් කිරීම 2025.11.13 දින සිට 2025.11.28 දින දක්වා කාර්යාල දිනයන්හි දී පෙ.ව.10.00 සිට ප.ව.3.00 දක්වා සිදු කෙරේ. ඉහත දැක්වෙන ආපසු නොගෙවන ගාස්තු සෙත්සිරිපාය පළමු අදියරේ, 4 වන මහලේ පිහිටා ඇති දෙපාර්තමේන්තුවේ ගිණුම් අංශයේ මුදල් අයකැමි වෙත ගෙවා ලබාගත් රිසිට් පත්, අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) වෙත ඉදිරිපත් කර අදාළ ලංසු ලේඛන ලබා ගත හැකිය.

එක් එක් වාහනය සඳහා වෙන වෙනම මිල ගණන් පත් ඉදිරිපත් කළ යුතුය. ලංසු ඉදිරිපත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන ලංසු සුරක්ෂණ තැන්පතුව ගෙවා තිබිය යුතු අතර සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ සරප් වෙත ගෙවූ එම කුවිතාන්සියේ මුල් පිටපත අනිවාර්යයෙන්ම මිල ගණන් සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

මුද්‍රා තබන ලද ලංසු ලේඛන 2025.11.13 දින සිට 2025.12.01 දින පෙ.ව.11.00 දක්වා කාර්යාල දිනයන්හි දී අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) ගේ කාමරයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය. එසේ නැතහොත් මුද්‍රා තබන ලද ලංසු ලේඛන පහත ලිපිනයට **නියමිත දින නියමිත වේලාවට ප්‍රථම ලැබෙනසේ** ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මිල ගණන් පත්‍රිකා බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ***"ධාවනයෙන් ඉවත් කරන ලද වාහන විකිණීම සඳහා මිල ගණන් කැඳවීම - වාහන අංකය ............"*** යනුවෙන් සඳහන් කළ යුතුය. **ලංසු ලේඛන භාර ගැනීම 2025.12.01 දින පෙ.ව. 11.00** ට අවසන් වන අතර ලංසු ලේඛන විවෘත කිරීම ලංසු ලේඛන භාර ගැනීම අවසන් වූ වහාම සිදු කෙරේ. ඒ සඳහා ඔබ හෝ ඔබගේ බලයලත් නියෝජිතයකු සහභාගී විය හැකිය.

මෙම විකිණීම සඳහා ඉදිරිපත් කර ඇති වාහන විකිණීමෙන් ඉවත්කර ගැනීම හෝ මිල ගණන් ලබා ගැනීමෙන් පසුව විකිණීම අවලංගු කිරීම දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ අභිමතය පරිදි සිදුවේ.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව,
1 වන අදියර
4 වන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

2025.11.13